ලෝක ව්‍යාප්ත වසංගතයක් ලෙසින් හමා යන කොවිඩ්-19 මේ වනවිට ලෝකයේම ජන ජීවිතය කෙරෙහි බරපතල ලෙසින් බලපා තිබේ. මෙවන් මොහොතක කොවිඩ්-19 හා සටන් කරන්නේ කෙසේද, රටක් ලෙසින් ඉදිරියට යන්නේ කෙසේද යන කරුණු සම්බන්ධව ජනමාධ්‍ය අතද බරපතල වගකීමක් තිබේ. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 පිළිබඳ වාර්තාකරණයන්හිදී පිළිපැදිය යුතු නිර්දේශ මාලාවක් හඳුන්වා දෙන්නේද එය අවධාරණය කරමිනි. එනමුත් ඇතැම් මාධ්‍ය එම වගකීම කෙතරම් බරපතල ලෙසින් ගන්නේද යන්න පැනයකි.

ඊට උදාහරණයක් වන්නේ මෙම දිවයින කතුවැකියයි. "සාතන් මස්සිනා සහ කොරෝනා කතන්දර (1)" යන මැයෙන් පළවන එහි යාපනයේ දේව මෙහෙයක් පැවැත්වූ කොවිඩ්-19 රෝගී දේවගැතිවරයා සම්බන්ධයෙන් ද්වේෂ සහගත ස්වරයෙන් විවිධ සඳහන් කිරීම් වෙයි. සාතන් හෙවත් යක්ෂයාගේ මස්සිනා ලෙසින් දිගින් දිගටම ඔහුව හඳුන්වන කතුවැකිය ඔහුව දුෂ්ටත්වයේ සංකේතයක් ලෙසින් නිරූපණය කරයි. එතැනින් නොනැවතී මෙම ද්වේෂ සහගත ආඛ්‍යානය තවත් ඉදිරියට ගෙන යමින්, මෙම දේවගැතිවරයාව ඝාතනය කෙරුවේ නම් එක් ගැටළුවක් අවසන් වන බවද සඳහන් කරයි!

මෙයට අමතරව දේවගැතිවරයාගේ සහ ඊට සහභාගී වූ ජනතාවගේ වාර්ගිකත්වය "දෙමළ" බවද කතුවැකිය පවසයි. රෝගීන් සම්බන්ධ වාර්තාකරණයේදී ජාතිය හා ආගම සඳහන් නොකරන ලෙසින් කොවිඩ්-19 වාර්තාකරණ නිර්දේශයන්හි සඳහන් වන බව දිවයින අමතක කිරීම ගැටළුවකි.

කොවිඩ්-19 වාර්තාකරණයන් පිළිබඳ නිර්දේශ මාලාවේ සඳහන් වන කරුණක් නම්, වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" ලෙසින් මිස "රෝගය පතුරුවන පුද්ගලයින්" ලෙසින් හැඳින්විය නොයුතු බවයි. එසේම ජනතාව තුළ වෛරය ඇතිවන ලෙසින් තොරතුරු වාර්තා කිරීමෙන් වළකින ලෙසද එම නිර්දේශ මාලාවේම සඳහන් වෙයි. මෙවන් පසුබිමකදී මෙම දේවගැතිවරයාව දුෂ්ටත්වයේ ප්‍රතිමූර්තියක් ලෙසින් පෙන්වමින්, ද්වේෂ සහගත ලෙසින් කරුණු දැක්වීම කෙතරම් ආචාර ධාර්මිකද? එපමණක් නොව, එම පුද්ගලයා ඝාතනය වූයේ නම් කොවිඩ්-19 ගැටළුව යම් පමණකින් විසඳෙනු ඇතැයි වැනි මතයක් ජනගත කිරීම ඔස්සේ දිවයින ජනතාවට ලබාදෙන්නේ කිනම් ආදර්ශයක්ද? එයින් සිදුවන්නේ කොවිඩ්-19 ආසාදිත/ආසාදනය වූ බවට සැක සහිත පුද්ගලයින් කෙරෙහි සමාජ ගර්හාවක් සහ ඉන් එහා ගිය ද්වේෂයක් ඇති කිරීම නොවන්නේද? මේ වගකීම් සහගත ජනමාධ්‍යකරණයද?

මූලාශ්‍ර:

https://mcusercontent.com/e5e1192127653987d107e6f98/images/76820bda-4513-4f3d-9d49-0f0637e78d5d.jpg
https://mcusercontent.com/e5e1192127653987d107e6f98/images/6a771830-d3bd-456e-8fbf-8e11372e9adc.png

**#SinhalaPress #Divaina**